# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1314 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023 திகதி

දිනය / Date – 18/10/2023 පැය 0800

## මාධ්‍ය නිවේදනය

**මුදල් සොරකමට අවශ්‍ය කර සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පුත්තලම කොට්ඨාස අපරාධ විමර්ශන අංශය**

2023.10.08 වන දින මදුරන්කුලිය 10 කණුව ප්‍රදේශයේ පිහිටි පුද්ගලික බැංකුවකට අයත් ATM යන්ත්‍රයකින් මුදල් රුපියල් 10,549,000/- ක් සොරකම් කිරීමකට අදාලව මදුරන්කුලිය පොලිස් ස්ථානයට වාර්තා වූ අපරාධයක් සම්බන්ධයෙන් මදුරන්කුලිය පොලිසිය හා පුත්තලම කොට්ඨාස අපරාධ විමර්ශන අංශය විසින් විමර්ශන ආරම්භ කර තිබිණි.

ඒ අනුව 2023.10.17 වන දින උදෑසන කාලයේදී අනුරාධපුර පොලිස් වසමේදී පුත්තලම කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් අපරාධයට සම්බන්ධ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර, සැකකරුවන්ගේ ප්‍රකාශ මත ඔවුන් සන්තකයේ තිබී සොරකම් කරන ලද මුදල් රුපියල් 9,277,000/- සොයාගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28, 32 හා 35 යන වයස්වල පසුවන ගල්ගමුව, වැරැල්ලගම හා අනුරාධපුර ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් දෙදෙනෙකු ATM යන්ත්‍ර වලට මුදල් තැන්පත් කිරීමට හා රැගෙන ඒම සඳහා යන පුද්ගලික ආරක්ෂක අංශ සේවකයින් දෙදෙනෙකු වන අතර අනෙක් සැකකරු මෝටර් රථ විදුලි කාර්මික ශිල්පියෙකි. සැකකරුවන් විසින් අපරාධය සිදුකිරීම සඳහා භාවිතා කල ඇඳුම්, ආරක්ෂිත හිස් වැසුමක්, ආරක්ෂිත කැමරාවට තීන්ත ඉසින ලද ස්ප්‍රේ ටින් එකක් සොයා ගෙන ඇත. අත්අඩංගුවට ගත් සැකකරුවන් හා නඩු භාණ්ඩ වැඩිදුර විමර්ශන සඳහා මදුරන්කුලිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත. මදුරන්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**